# ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන්හී දියයට පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සංචාරකයන්ට ප්‍රවර්ධනය කිරීම පිළිබඳ විමසුමක්.

ජී. ඇම් සුමේධ විරාජ් අපෝන්සු*

ශ්‍රී ලංකාව තුළ දියයට උරුමයන් සොයා ගැනීමට හා ගවේෂණයට අවැසි විශේෂඥ ඥාණය හා පහසුකම් නිර්මාණය වෙමින් පවතින යුගයක එවැනි වටිනා උරුම සංචාරකයන්ට විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරිමට අවධානයක් යොමු නොවීමත්, නිසි ප්‍රතිලාභ ළඟාකරගත නොහැකිවීමත් අභාග්‍යයට කරුණකි. එහෙයින් ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන්හී දියයට පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමයන් රැකගනිමින් සංචාරකයන්ට ප්‍රවර්ධනය කිරීමටත්, ඉන් ලද හැකි ප්‍රතිලාභයන් සහ මේ සම්බන්ධව දැනට පවතින දුබලතා මඟහරවාගෙන විධිමත් සැලසුමක් නිර්මාණය කිරීම පිළිබඳවත් විමසුමක් සිදුකිරීමේ අටියෙන් මෙම අධ්‍යයනය සිදුකෙරේ. ඒ අනුව මෙම අධ්‍යයනය තුළ උතුරු, දකුණ, නැගෙනහිර ප්‍රදේශයන් හි වූ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් මෙන්ම එම ප්‍රදේශ ආශ්‍රිතව හඳුන්වාදිය හැකි නව දියයට උරුමයන් සංචාරක ආකර්ශන ලෙස හඳුන්වාදීම, එම උරුමයන් ආරක්ෂා කිරීමට මෙතෙක් රජයෙන් ගෙන ඇති පියවරයන් හා අනාගතයේ ගත යුතු නෛතික පියවරයන්, එම සම්පත් ප්‍රවර්ධනයට රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හී කාර්යභාරය, එම සම්පත් උපායශීලිව ප්‍රවර්ධනය කරමින් සංචාරකයන්ගේ ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත දිනා ගැනිමට සංචාරකයාට ඉදිරිපත් කළ හැකි ක්‍රමවේද, මෙහි සැබෑ ප්‍රතිලාභ දේශීයයන්ට හිමිවන ලෙසත්, උරුම ආරක්ෂා වන ලෙසත් සැලසුම් ඉදිරිපත් කිරිම අරමුණු වේ.

මෙම අධ්‍යයනය පුරාවට එම ප්‍රදේශයන්හී සංචාරය කරමින් ප්‍රදේශවාසීන්ගෙන් ද, මුහුදු පුරාවිද්‍යා ඒකකයේ නිලධාරීන්ගෙන් ද, නාවුක හමුදාවෙන් ද, වනජීවි දෙපාර්තමේන්තුවෙන් ද, දියයට ක්‍රියාකාරකම් හා සම්බන්ධ ආයතනයන්ගෙන් ද, කිමිදුම්කරුවන් වැනි මෙම ක්ෂේත්‍රයේ නියැලෙන්නන් ගෙන් ද සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලීන් යොදාගනිමින් මේ සඳහා අවශ්‍ය ප්‍රාථමික තොරතුරු රැස්කරගත් අතර දියයට ආකර්ශණ හා උරුමයන් හා සම්බන්ධව ප්‍රකාශයට පත්කර ඇති ලිඛිත ග්‍රන්ථාවලීන්, සඟරා, පුවත්පත් ලිපි හරහා ද්විතීයික දත්ත එකතුකර ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන් තුළ දියයට සංචරණය ප්‍රවර්ධනය කිරීමේදී කිමිදුම් ආයතනයන් වෙත හා සංචාරක කිමිඳුම්කරුවන් වෙතද රාජ්‍ය පාර්ශවයෙන් හිමිවිය යුතු වරප්‍රසාද කවරේද යන්නත් දියුණුවට විරුද්ධව පවතින බාධාවන් කවරේද යන්නත්, ඒකී බාධක මඟහරවාගෙන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කළ හැක්කේ කෙසේද යන්නත්, එහිදි සංශෝධනය කළ යුතු හා එක්කළ යුතු නීති කවරේද යන්නත් පිළිබඳව මෙහිදි යෝජනා ලෙස ඉදිරිපත් කෙරේ.

ප්‍රමුඛ පද :- දියයට උරුමයන් , දියයට සංචරණය ප්‍රවර්ධනය

* පුරාවිද්‍යා අධ්‍යනාංශය කැලණිය, විශ්වවිද්‍යාලය sumedaviraj1@gmail.com